# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/26 - 2017 ජුනි මස 20 වැනි අඟහරුවාදා - 2017.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47(V)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ 6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති, මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, මේ නියමය මගින් :-

(අ) ඉහත කී ආඥා පනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''යුදගනාව රජ මහා විහාර පූජා භූමි ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ''යුදගනාව රජ මහා විහාර පූජා භූමි ප්‍රදේශය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***''යුදගනාව රජ මහා විහාර පූජා භූමි ප්‍රදේශය'' සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේ ජනරාල්ගේ 2016 ජුනි 08 වැනි දින සහ අංක M.O./BTT/2016/232 දරන සැලැසුමේ (හිමිකම් පිඹුරු අංක 100016) නිරූපිත ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළේ සුළු කොට්ඨාසයේ, යුදගනාව ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 25.4840 (අ. 62, රූ. 3, පර්. 35.58) ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | හි. පි. 100016 |
| *නැගෙනහිරට* | : | හි. පි. 100016 |
| *දකුණට* | : | හි. පි. 100016 |
| *බටහිරට* | : | හි. පි. 100016 |

07-94

1A - G 25764 — 27 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් ලබාගත කළ හැක.*